# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2251/63 - 2021 ඔක්තෝබර් මස 29 වැනි සිකුරාදා - 2021.10.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51(ix)

### (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 122, 122අ වගන්ති සහ VIIඅ කොටස සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**පවිත්‍රා වන්නිආරච්චි,**
ප්‍රවාහන අමාත්‍ය.

2021 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2015 නොවැම්බර් මස 2 වන දින අංක 1939/4 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2015 අංක 1 දරන මෝටර් වාහන (රියදුරු පාසල්, රියදුරු උපදේශක සහ සහකාර රියදුරු උපදේශක) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) 8 වන නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''8. රියදුරු පාසලක දී, යම් තැනැත්තකු විසින් පුහුණුව සම්පූර්ණ කර ඇති අවස්ථාවක දී, පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයේ ආකෘතියෙන් යුතු සහතිකයක් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.''

(2) 9 වන නියෝගයේ 2 වන අයිතමය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| බලපත්‍රලාභී රියදුරු උපදේශකවරුන් | | | බලපත්‍රලාභී රියදුරු උපදේශකවරුන්ගේ පංති තුනෙන් යම් එක් පන්තියකින්, ''බී'', ''බී1'', සහ ''ඒ'' යන වර්ග කර ඇති පන්තිවල රියදුරු බලපත්‍රයක් සඳහා උපදෙස් ලබා දීමට බලය පවරන ලද අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු |
| (අ) ''ඒ'' පන්තියේ බලපත්‍රලාභී උපදේශකවරු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |
| (ආ) ''බී'' පන්තියේ බලපත්‍රලාභී උපදේශකවරු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |

| | | | |
|---|---|---|---|
| (ඇ) ''සී'' පන්තියේ බලපත්‍රලාභී උපදේශකවරු | ''බී'', ''බී1'', සහ ''ඒ'' යන ලෙස වර්ග කර ඇති පන්තිවල රියදුරු බලපත්‍රයක් සඳහා උපදේශකයකු වීමට බලය පවරන ලද අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | ''බී'', ''බී1'', සහ ''ඒ'' යන ලෙස වර්ග කර ඇති පන්තිවල රියදුරු බලපත්‍රයක් සඳහා උපදේශකයකු වීමට බලය පවරන ලද අවම වශයෙන් එක් රියදුරු උපදේශකවරයකු | |

(3) 14 වන නියෝගයේ (ඇ) වන ඡේදයේ (iii) වන සහ (iv) වන අයිතම ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

''(iii) ''සී'' පන්තියේ රියදුරු උපදේශක
''බී'', ''බී1'' සහ ''ඒ'' පන්ති සඳහා රියදුරු බලපත්‍රය

එසේ වුව ද, ඉල්ලුම් කරන දිනයට පෙර අවම වශයෙන් අවුරුදු පහකට පෙර ලබාගත් වලංගු රියදුරු බලපත්‍රයක් සහිත යම් ඉල්ලුම්කරුවෙකුට ඔහු සුදුසුකම් දරන්නා වූ ''බී'', ''බී1'', හෝ ''ඒ'' ලෙස වර්ග කරන ලද රියදුරු බලපත්‍ර පන්තිවලින් එක් රියදුරු බලපත්‍ර පන්තියක හෝ රියදුරු බලපත්‍ර පන්ති කිහිපයක උපදේශකවරයකු වීමට ඒ තැනැත්තාට බලය පවරමින් ''සී''පන්තියේ රියදුරු උපදේශක බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

''(iv) සහකාර රියදුරු උපදේශක
''බී'', ''බී1'', සහ ''ඒ'' පන්ති සඳහා රියදුරු බලපත්‍රය.

එසේ වුව ද, ඉල්ලුම් කරන දිනයට පෙර අවම වශයෙන් අවුරුදු පහකට පෙර ලබාගත් වලංගු රියදුරු බලපත්‍රයක් සහිත යම් ඉල්ලුම්කරුවෙකුට ඔහු සුදුසුකම් දරන්නා වූ ''බී'', ''බී1'', හෝ ''ඒ'' ලෙස වර්ග කරන ලද රියදුරු බලපත්‍ර පන්තිවලින් එක් රියදුරු බලපත්‍ර පන්තියක හෝ රියදුරු බලපත්‍ර පන්ති කිහිපයක සහකාර උපදේශකවරයකු වීමට ඒ තැනැත්තාට බලය පවරමින් සහකාර රියදුරු උපදේශක බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.''

(4) 16 වන නියෝගයේ (අ) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-
''(අ) රියදුරු උපදේශක බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලබන යම් තැනැත්තකු -

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය ගණිතය සහ සිංහල හෝ දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් හයකින් සම්මාන දෙකක් සහිතව පෙනී සිටීම් දෙකකට නොවැඩි ගණනකින් සමත්ව තිබීම හෝ ඊට සමාන සුදුසුකමක් වන අවම සුදුසුකමක් තිබිය යුතු ය ; හෝ

(ii) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම III සහතිකයක් තිබිය යුතු ය ; හෝ

(iii) ඉල්ලුම් කරන දිනයට පෙර අවුරුදු පහක් සඳහා සහකාර රියදුරු උපදේශකවරයකු ලෙස පළපුරුද්ද තිබිය යුතු ය;''.

11 - 259

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.